RG/NB/01/චක්‍රලේඛ

2016.12.7

චක්‍රලේඛ අංක 12/2016

සියලුම ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් වෙත,

**ඉඩම් ලේඛන ලියාපදිංචි කිරීම විධිමත් කිරීම.**

බොහෝ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලවල දෝෂ සහිතව ලේඛන ලියාපදිංචි කිරීම සහ අත් අකුරුවල අපැහැදිලි බවත් නිවැරදි නොවීමත් හේතුවෙන් මහජනතාවගෙන් හා විවිධ ආයතනවලින් නිරන්තර පැමිණිලි ලැබෙමින් පවතී. බොහෝ කාලයක සිට මේ සම්බන්ධයෙන් ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් විවිධ අවස්ථාවලදී දැනුවත් කලද මේ වනතුරු මෙම තත්ත්වය පාලනය කිරීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ගයන් ගෙන ඇති බවක් නොපෙනේ.

02. දෙපාර්තමේන්තු නියෝග 254 කෙරෙහි ඔබගේ දැඩි අවධානය යොමු කරන ලෙස දන්වන අතර ලියාපදිංචි කිරීම සඳහා නිලධාරීන් යෙදවීමේදී පහත උපදෙස් පිළිපදින ලෙස තරයේ දන්වා සිටිමි.

I. පැහැදිලි හා කියවිය හැකි අත් අකුරු සහිත නිලධාරීන් පමණක් ලියාපදිංචි කිරීමේ කටයුතු සඳහා යෙදවීම.

II. එසේ යෙදවීමේදී අත්අකුරු පරීක්ෂා කර බලා ඔබ විසින් සෑහීමට පත්වන නිලධාරීන් පමණක් යෙදවීම.

III. ලියාපදිංචි කිරීම සම්බන්ධව නිවැරදි උපදෙස් ලබාදෙමින් ඒ සම්බන්ධයෙන් හැකියාවක් ඇති නිලධාරීන් පමණක් ලියාපදිංචි කිරීම සඳහා යෙදවීම.

IV. ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ 35 වගන්තිය යටතේ නිවැරදි කිරීම සඳහා ප්‍රධාන කාර්යාලය වෙත ලැබෙන ඉල්ලීම් දිනෙන් දින සීඝ්‍ර ලෙස ඉහල යමින් පවතී. එබැවින් ඔප්පු අත්සන් කරන නිලධාරීන් අදාළ ලේඛනයේ සඳහන් තොරතුරු නිවැරදිව පත්ඉරුවල සටහන් යොදා ඇති බවට පරීක්ෂාවෙන් අනතුරුව පමණක් ඔප්පු අත්සන් කිරීම.

03. මෙම කරුණු සම්බන්ධයෙන් ඉඩම් රෙජිස්ට්‍රාර් දැඩි අවධානය යොමු කළ යුතු අතර ඉහත දක්වා ඇති පරිදි කටයුතු නොකරන නිලධාරීන් සම්බන්ධයෙන් නිරාකරණ ලබා ගැනීමටත් ඔවුන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කිරීමටත් සිදුවන බව දන්වා සිටිමි.

04. මෙම චක්‍රලේඛය අදාළ සියලු නිලධාරීන් දුටු බවට හා ඒ අනුව ක්‍රියාකරන බවට සියලු නිලධාරීන්ගේ අත්සන් සහිත ලිඛිත සාක්ෂියක් මා වෙත ඉදිරිපත් කරන්න.

රෙජිස්ට්‍රාර් ජනරාල්

ඊ. එම්. ගුණසේකර
රෙජිස්ට්‍රාර් ජනරාල්

පිටපත් : 1. ලේකම් - ස්වදේශ කටයුතු අමාත්‍යාංශය - දැන ගැනීම සඳහා සහ අවශ්‍ය කටයුතු සඳහා
2. රෙජිස්ට්‍රාර් ජනරාල් - පාලන - දැන ගැනීම සඳහා